Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2022 පෙබරවාරි 17, කොළඹ

## දරුවන්ගේ ක්‍රියාශීලී ජීවිතය දිරිමත් කිරීමට මයිලෝ වෙතින් 'Milo Moments' වැඩසටහන

- දරුවන් 12,000ක් වෙත ක්‍රීඩා සහ අධ්‍යාපනික උපකරණ පිරිනැමේ

නෙස්ලේ මයිලෝ ගෙනෙන නවතම ප්‍රවර්ධන වැඩසටහන වන *'Milo Moments'*, 2022 ජනවාරි 1 වැනිදා සිට ආරම්භ විය. මාස තුනක් පුරා පැවැත්වෙන මෙම වැඩසටහන යටතේ සෑම සතියකම දරුවන් 1,000ක් ජයග්‍රාහකයින් ලෙස තෝරාගැනෙන අතර, ඔවුන්ට ලැප්ටොප්, ටැබ්, රීලෝඩ්, ස්කූටර්, බයිසිකල්, ස්කේට් බෝඩ්, බාස්කට් බෝල්, ෆුට්බෝල්, ස්කිපින් රෝප්, සපත්තු සහ ට්‍රැම්පොලින් ආදී ත්‍යාග පිරිනැමේ. සිය පාරිභෝගිකයින්ට ජීවිතයේ ඉදිරියටම ගමන් කිරීමට සහාය වන සන්නාමයක් ලෙස, නෙස්ලේ මයිලෝ අඛණ්ඩව දෙවැනි වරටත් මෙම ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කරයි. ගෝලීය වසංගතයත් සමඟ ඇති වූ අභියෝග හමුවේ වුව ද ක්‍රියාශීලී සහ නිරෝගිමත් ජීවන රටාවක් වෙනුවෙන් දරු පරපුර දිරිමත් කිරීම එහි අරමුණයි.

"වසංගතය පැතිරයාමත් සමඟ දරුවන් නිවසට සීමා වුණු අතර, එළිමහන් ක්‍රීඩා සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් ඔවුන්ට මඟ හැරුණි. නිරෝගිමත් ජීවිතයක් උදෙසා ක්‍රීඩා සහ වෙනත් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරතවීම වැදගත් බව අපි සැමවිටම විශ්වාස කරන්නෙමු. එනිසා මෙම අභියෝගකාරී වාතාවරණය තුළ පවා ක්‍රියාශීලීව කාලය ගත කළ හැකි බව දරුවන්ට මතක් කිරීම අපගේ අභිලාෂයයි. එවන් පසුබිමක දිවයින පුරා විසිරුණු දරුවන් 12,000කට ක්‍රීඩා සහ අධ්‍යාපනික උපකරණ පිරිනමමින්, ඔවුන්ගේ අධ්‍යාපනික අවශ්‍යතාවයන්ට සහාය වන අතරතුර ශාරීරිකව ක්‍රියාශීලී වීමට ද අපි සහාය වන්නෙමු", යැයි නෙස්ලේ ලංකා සමාගමේ කාණ්ඩ අලෙවි කළමනාකරු මොහොමඩ් අලි මහතා පැවසීය.

'*Milo Moments*' වැඩසටහනේ ජයග්‍රාහකයින් පිරිසකට ත්‍යාග පිරිනැමීමේ උත්සවයක් 2022 ජනවාරි 27 වැනි දින කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ද සහයෝගීත්වයෙන් සංවිධානය කෙරුණි. මෙම අවස්ථාවට සහභාගී වූ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත ද සිල්වා මහතා, "නිරෝගිමත් පරපුරක් ගොඩනැගීම වෙනුවෙන් නෙස්ලේ මයිලෝ වැනි සන්නාමයක් සමඟ අත්වැල් බැඳගැනීමට හැකිවීම පිළිබඳව අපි මහත් සතුටට පත්වන්නෙමු. මෙම වැඩසටහන මගින් පිරිනැමෙන ත්‍යාග හරහා ක්‍රියාශීලී ජීවිතයකට දරුවන් දිරිමත් කරන අතර, ඔවුන්ගේ ක්‍රීඩා දක්ෂතා සහ කුසලතා ද වර්ධනය කිරීමට අත්වැලක් වනු ඇත", යනුවෙන් පැවසුවේය.

මෙම තරඟයට ඇතුළුවීම සඳහා පාරිභෝගිකයන් මයිලෝ RTD (ක්ෂණික පානයක්) රස විඳින ආකාරය දැක්වෙන ඡායාරූපයක් ගෙන WhatsApp හෝ Viber හරහා 0777680077 දුරකථන අංකයට හෝ *@MiloSriLanka* Facebook පිටුවට සෘජුවම එවිය යුතුය. එසේ එවීමේදී නම, දුරකථන අංකය, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය ද සඳහන් කළ යුතුය. තරඟාවලියේ කොන්දේසිවලට අනුකූලව සෑම සතියකම පැවැත්වෙන දිනුම් ඇදීමේදී අහඹු ලෙස ජයග්‍රාහකයින් 1,000 බැගින් තෝරාගැනීමට නියමිත ය. එම ජයග්‍රාහකයින්ට ලැප්ටොප්, ටැබ්, රීලෝඩ්, ස්කූටර්, බයිසිකල්, ස්කේට් බෝඩ්, බාස්කට් බෝල, ෆුට්බෝල, ස්කිපින් රෝප්, සපත්තු, හෝ ට්‍රැම්පොලින් ආදී ත්‍යාග හිමි වේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු *@MiloSriLanka* Facebook සහ Instagram පිටුවෙන් ලබාගත හැක.

වසර 115කට වැඩි කාලයක් පුරා මෙරට ක්‍රියාත්මක නෙස්ලේ සමාගමේ ප්‍රමුඛතම නිෂ්පාදනයකි මයිලෝ. විටමින් සහ ඛනිජ ලවණවලින් සරු කළ මයිලෝ නිපදවනු ලබන්නේ උසස්ම තත්ත්වයේ එළකිරිවල යහ ගුණය, මෝල්ට් සාරය සහ හොඳම තත්ත්වයේ කෝකෝවා භාවිත කරමිනි. උසස්ම ප්‍රමිතිය වෙනුවෙන් ලොව පුරා ප්‍රසිද්ධියක් උසුළන නෙස්ලේ සමාගම, කුරුණෑගල පිහිටි තම අති නවීන නිෂ්පාදනාගාරයේදී මයිලෝ නිෂ්පාදනය කරයි.

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |